

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



පෙරහුරු පරීක්ෂණය - 2025(2026)

11 ශ්‍රේණිය	ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II	කාලය :පැය 03 යි.

සැලකිය යුතුයි :-

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

හෝටල් කළමණාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති රිවිඳු තමාගේම ව්‍යාපාරයක නිරත වීමට ඇති කැමැත්ත නිසා තම නිවසේම කොටසක දිවා ආහාර සැපයීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. බත් සහ කෙටි ආහාර සැපයු අතර ප්‍රදේශය තුළ ආහාර සඳහා විශාල ඉල්ලුමක් පවතී.

(01) මෙම සිද්ධියේ සඳහන් අවශ්‍යතාවය කුමක් ද?
(1) නිවාස (2) අධ්‍යාපනය (3) ආහාර (4) ආරක්ෂාව

(02) මෙම සිද්ධිය තුළ ඇති ව්‍යාපාරය සතු ශක්තියක් වන්නේ,
(1) හොඳ සේවකයින් සිටීම
(2) නගරයට ආසන්න වීම
(3) රිවිඳු හෝටල් කළමනාකරණ පාඨමාලාවක් හදාරා තිබීම
(4) ආහාරවල පිරිසිදු බව

(03) රිවිඳුගේ ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයන් ඇත.
(2) මෙම ව්‍යාපාරය මහා පරිමාණ ව්‍යාපාරයකි.
(3) මෙම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයකි
(4) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ

(04) ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ගොඩනැගී ඇති ව්‍යාපාරයකි.
(1) තනි පුද්ගල ව්‍යාපාර (2) සීමිත සමාගම්
(3) සමූපාකාර සමිති (4) රාජ්‍ය දෙපාර්තමේන්තු

(05) හවුල් ව්‍යාපාරවල දක්නට හැකි ලක්ෂණයක් වන්නේ,
(1) නීතිමය පුද්ගලභාවයක් පැවතීම (2) කොටස් නිකුත්කර අරමුදල් රැස්කිරීම
(3) සමාජ සුබසාධනය අරමුණ කරගැනීම (4) සාමූහික තීරණ ගත හැකි වීම

- ව්‍යාපාර පරිසරය පිළිබඳව වඩාත් උනන්දුවන තනුජ තම බිම්මල් ව්‍යාපාරයට පුහුණු සේවකයන් බඳවා ගැනීමට අදහස් කරයි.

(06) ව්‍යාපාරයක බාහිර පරිසරයේ ඇතුලත් සාධක පමණක් ඇති පිළිතුර වන්නේ,
(1) අයිතිකරුවෝ, ගනුදෙනුකරුවෝ, සේවකයෝ
(2) සේවකයෝ, අයිතිකරුවෝ, ගනුදෙනුකරුවෝ
(3) ප්‍රජාව, ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ
(4) සේවකයෝ, සැපයුම්කරුවෝ, රජය

(07) ව්‍යාපාරයකට අභ්‍යන්තර පරිසර සාධක අධ්‍යයනයෙන් ලබාගත හැකි ප්‍රයෝජනයකි,

(1) ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිවීම
(2) දුර්වලතා හා තර්ජන හඳුනාගත හැකිවීම
(3) අවස්ථා හා ශක්තීන් දැනගත හැකිවීම
(4) ශක්තීන් හා තර්ජන හඳුනාගත හැකිවීම

(08) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයක් ලෙස කළමනාකරුවන්ගේ අරමුණක් නොවන්නේ,

(1) රැකියා වර්ධනය
(2) ව්‍යාපාරයේ අභ්‍යන්තර වර්ධනය
(3) කළමණාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම
(4) රජයට බදු අයකර දීම

(09) ව්‍යාපාර සංවිධානයක හිමිකාරිත්වය අනුව වර්ග කෙරෙන ආකාරය දැක්වෙන ප්‍රකාශය වන්නේ,

(1) ලාභ ලබන ව්‍යාපාර සහ ලාභ නොලබන ව්‍යාපාර
(2) කුඩා පරිමාණ හා මහා පරිමාණ
(3) පෞද්ගලික අංශයහා සුභ සාධක අංශය
(4) පෞද්ගලික අංශය හා පොදු අංශයේ ව්‍යාපාර

(10) පරිමාණ අනුව ව්‍යාපාර වර්ග කිරීමේ දී සලකා බලන සාධකයක් නොවන්නේ,

(1) සේවක සංඛ්‍යාව
(2) අයිතිකරුවන් සංඛ්‍යාව
(3) භාවිතා කරන බල ශක්ති ප්‍රමාණය
(4) ව්‍යාපාරයට ඇති වෙළෙඳපළ කොටස

(11) පහත බැංකු අතරින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන්නේ,

(1) ජාතික ඉතිරි කිරීමේ බැංකුව
(2) සණස සංවර්ධන බැංකුව
(3) උෆව සංවර්ධන බැංකුව
(4) ලංකා බැංකුව

(12) පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වාණිජ බැංකුවක ගනුදෙණු කරුවෙකුට ණයපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ
(2) වාණිජ බැංකුවක ගනුදෙණුකරුවෙකුට හරපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ
(3) ''සි බැන්ක් වීසා'' මහජන බැංකුව නිකුත් කරන ණය කාඩ් පතකි
(4) විද්‍යුත් මුදල්, චෙක්පත් වෙනුවට ආදේශ කළ හැකි ගෙවීම් ක්‍රමයක් නොවේ.

(13) විද්‍යුත් මුදල් යොදාගෙන ගණුදෙනු කිරීමේ වාසියකි,

(1) වට්ටම් ලැබීම
(2) ණය ගනුදෙණු පහසුවීම
(3) ක්ෂණික බව
(4) අමතර පිරිවැයක් දැරීමට සිදුවීම

➢ චමෝදි දිසානායකට අයත් මෝටර් රථය ඇයගේ යෙහෙළියක වූ ශානිකා ගිම්හානි රැගෙන යන අතරතුර අනතුරකට භාජනය විය. ගිම්හානි විසින් රක්ෂණ ආයතනයෙන් වන්දි ඉල්ලා සිටි නමුදු ඇයට වන්දි ලබා නොදෙන බව රක්ෂණ ආයතනය පවසයි.

(14) ගිම්හානිට වන්දි ලබා ගැනීමට නොහැකි වීමට බලපාන රක්ෂණ මූලධර්මය වන්නේ,

(1) හානි පූර්ණ මූලධර්මය
(2) උපරිම විශ්වාසය
(3) ආදේශනය
(4) රක්ෂණ හිමිකම

(15) ඉහත සිද්ධියට අනුව රක්ෂිතයා හා රක්ෂකයා පිළිවෙලින්,

(1) චමෝදි දිසානායක සහ ශානිකා ගිම්හානි
(2) ශානිකා ගිම්හානි සහ රක්ෂණ ආයතනය
(3) චමෝදි දිසානායක සහ රක්ෂණ ආයතනය
(4) රක්ෂණ ආයතනය සහ චමෝදි දිසානායක

(16) වාචික සන්නිවේදනයට යොදාගත හැකි මාධ්‍ය වන්නේ,

(1) රූපවාහිනිය, ලිපි, රැස්වීම්
(2) රැස්වීම්, සාකච්ඡා, පුවත්පත්
(3) දැන්වීම්, ගුවන් විදුලි නිවේදන, සාකච්ඡා
(4) වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ

(17) කළමනාකරණ කාර්යයන්ට අදාළ පහත තොරතුරු ඇසුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

A ව්‍යාපාර අරමුණු තිරණය කිරීම සැලසුම්කරණයට අයත් වේ

B කාර්යක්ෂමතාවය යනු ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීමයි

C සැලසුම් කළ කටයුතු ඒ ආකාරයෙන්ම ඉටුවී ඇත්දැයි සොයා බැලීම පාලනයයි

D ව්‍යාපාරයක මානව සම්පත් හැසිරවීමේ ක්‍රියාවලිය සංවිධානකරණයයි

(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

(18) අලෙවිකරණ මිශ්‍රයේ ''මිල'' විචල්‍යයට අයත් සාධක ඇතුලත් කාණ්ඩයක් වන්නේ,

(1) ගෙවීම්ක්‍රම, ණය කොන්දේසි (2) ලැයිස්තු මිල, ප්‍රවාහනය

(3) ගුණත්වය, ප්‍රචාරණය (4) වට්ටම්, ඇසුරුම

(19) ගිණුම්කරණයේ අරමුණ වන්නේ,

(1) ව්‍යාපාරය ලාභ උපරිම කිරීමයි

(2) ගනුදෙණුකරුවන් ආරක්ෂා කිරීමයි

(3) ඇල්මැති පාර්ශව වලට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීමයි

(4) බදු වලින් ආරක්ෂා වීමයි

(20) අතීත ගනුදෙණුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන, ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු අගය හඳුන්වන්නේ,

(1) හිමිකම් (2) වගකීම් (3) වියදම් (4) වත්කම්

(21) පහත සඳහන් ගනුදෙණු අතරින් හිමිකමට බලපෑමක් ඇති කරන ගනුදෙණුව වන්නේ,

(1) රු. 60 000 ක් ගෙවා ලී බඩු මිලදී ගැනීම

(2) ණයහිමියන්ට රු. 5000 ක් චෙක් පතකින් ගෙවීම

(3) රු. 7000 ක රක්ෂණ ගාස්තු ගෙවීම

(4) රු. 14000 ක් ණයගැතියෙකුගෙන් ව්‍යාපාරයට ලැබීම

➢ ගිත්මිගේ ව්‍යාපාරය ණය හිමියෙකුට රු. 30 000 ක් ගෙවු අතර අඩු කළ වට්ටම 10% කි.

(22) ඉහත ගනුදෙනුවලට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ලද වට්ටම හර 30 000 යි
මුදල් බැර 30 000 යි

(2) මුදල් ගිණුම බැර 27 000 යි
ලද වට්ටම බැර 3000 යි
ණය හිමියෝ බැර 30 000 යි

(3) ණය හිමියෝ (හර) 30 000 යි
මුදල් බැර 2 700 යි
ලද වට්ටම් බැර 3 000 යි

(4) ණය හිමියෝ බැර 30 000 යි
මුදල් හර 30 000 යි

➢ මෙත්සරගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර වෙනසක් දක්නට ලැබුණි.

(23) එම වෙනසට බලපැන හේතුවක් නොවිය හැක්කේ,

(1) බැංකු ගාස්තු, බැංකුව අයකරගෙන තිබීම

(2) ණයගැති ප්‍රේෂණ ගිණුමට එකතු වීම

(3) ණය හිමියෙකුට රු. 7000 ක් මුදලින් ගෙවීම

(4) ස්ථාවර නියෝග මත බැංකු ණය වාරිකය ගෙවීම

(24) ව්‍යාපාරයක බැංකු ගිණුමේ බැර ශේෂය,

(1) වත්කමකි (2) වගකීමකි (3) හිමිකමකි (4) ආදායමකි

(25) ණයගැතියෙකු වූ අමීෂගෙන් ලැබුණු රු. 25 000 ක චෙක්පත ව්‍යාපාරයේ ලෙජරයේ සටහන් කර ඇත. එම චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කිරීමේ දී තැබිය යුතු ද්විත්ව සටහන වන්නේ,

(1) ණය ගැතිගිණුම හර 25000
බැංකු ගිණුම බැර 25000

(2) බැංකු ගිණුම හර 25000
ණයගැති ගිණුම බැර 25000

(3) බැංකු ගිණුම හර 25000
මුදල් ගිණුම බැර 25000

(4) මුදල් ගිණුම හර 25000
ණය ගැති ගිණුම බැර 25000

(26) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 7000 කි. 2025.01.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 1200 කි. 2025.02.01 දින ලැබුණ මුදල වන්නේ,

(1) රු. 7000 කි (2) රු. 1200 කි (3) රු. 8200 (4) රු. 5800

(27) ව්‍යාපාරයක ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළියෙල කරන ශේෂ පිරික්සුමකින් අනාවරණය නොවන වරද දක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 3400 ක රක්ෂණ ගාස්තු ගෙවීම, රක්ෂණ ගාස්තු ගිණුමේ පමණක් සටහන් වීම
(2) රු. 15000 ක ලී බඩු අලුත්වැඩියා වියදමක් ලී බඩු ගිණුමේ හරට සටහන් වීම
(3) රු. 5200 ක විදුලි ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම
(4) ගැනුම් ජර්නලයේ එකතුව රු. 50000 ක් රු. 5000 ක් ලෙස ගැනුම් ගිණුමේ සටහන් වීම

(28) ''රන්තරු'' ක්‍රීඩා සමාජයේ 2024 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 200 කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. දහදෙනෙකු සාමාජික මුදල් ගෙවා නැත. ආදායම් ප්‍රකාශයේ 2024 වර්ෂයට අදාලව සටහන් කරන සාමාජික මුදල් ආදායම වන්නේ,

(1) රු. 100 000 කි (2) රු. 10 000 කි (3) රු. 5000 කි (4) රු. 2000 කි

(29) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ලැබීම් හා ගෙවීම් ගිණුම,

(1) හිමිකම් ගිණුමකි (2) වියදම් ගිණුමකි (3) වගකීම් ගිණුමකි (4) වත්කම් ගිණුමකි

(30) ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළියෙල කරන ආදායම් ප්‍රකාශනය බොහෝ විට ලාභ අරමුණු කර ගත් ව්‍යාපාරවල,

(1) මුදල් ගිණුමට සමාන වේ
(2) ලාභ හෝ අලාභ ප්‍රකාශනයට සමාන වේ
(3) ගැනුම් ජර්නලයට සමාන වේ
(4) බැංකු ගිණුමට සමාන වේ

(31) රසාංජනගේ ව්‍යාපාරයේ 2024.01.01 දිනට ලීබඩු වල පිරිවැය රු. 90 000 ක් විය. ලී බඩු වාර්ෂිකව 10% ක් ක්ෂය කරනු ලබන්නේ නම් ක්ෂය ගිණුම්ගත කිරීමට අදාල ජර්නල් සටහන තෝරන්න.

(1) ලී බඩු ක්ෂය ගිණුම හර 9000
ලී බඩු ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර 9000

(2) ලීබඩු ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැර 9000
මුදල් ගිණුම හර 9000

(3) ලාභ හෝ අලාභ ප්‍රකාශනය හර 90 000
ලී බඩු ගිණුම ප්‍රකාශනය බැර 90 000

(4) ලී බඩු ක්ෂය ගිණුම හර 81000
ලී බඩු ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැර 81000

(32) අනුහස්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුමේ ණයගැති ශේෂය රු. 60 000 කි. බොල් ණය ලෙස රු. 5000 ක හර ශේෂයන් ද ඇත. වර්ෂයට අදාලව 5% ක් බොල් ණය කපා හැරීමට තීරණය කළේ නම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2024.12.31 දිනට දක්වෙන ණයගැති ශේෂය වන්නේ,

(1) රු. 65 000 කි (2) රු. 57000 කි (3) රු. 52000 කි (4) රු. 55000 කි

(33) අනුහස්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයට සකස් කරන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ බෝල්ණය ලෙස දක්වන අගය කුමක් ද?

(1) රු. 60 000 කි (2) රු. 3000 කි (3) රු. 8000 කි (4) රු. 12000 කි

➢ **පහත සඳහන් තොරතුරු භාවිතා කරමින් අංක 34 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ගවේෂ්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

විස්තරය	හර	බැර
විකුණුම්		156 000
ගැණුම්	104 000	
මුදල් ශේෂය	100 000	
2024.01.01 තොගය	40 000	
10% බැංකු ණය		120 000
ගෙන ඒමේ කුලී	5000	
ලද වට්ටම්		12 000
ණය ගැතියෝ	34 000	
ණය හිමියෝ		40 000
සේවක වැටුප්	45 000	
ලී බඩු උපකරණ	160 000	
බැංකු ණය පොලී	5000	
12% ස්ථාවර තැන්පතු	100 000	
ප්‍රාග්ධනය		265 000
	593 000	**593 000**

අතිරේක තොරතුරු :-

1. 2024.12.31 දිනට තොගය රු. 30 000
2. ණය ගැතියන්ගෙන් බොල්ණය ලෙස රු. 2000 ක් කපා හැරිය යුතුය
3. රු. 4000 ක විදුලි ගාස්තු ගෙවිය යුතුව ඇත

(34) මෙම ව්‍යාපාරයේ වර්ෂය තුළ විකිණීමට ඉදිරිපත් කළ තොගය,

(1) රු. 149 000 කි (2) රු. 144 000 කි (3) රු. 40 000 කි (4) රු. 109 000 කි

(35) ගවේෂ්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය,

(1) රු. 169 000 (2) රු. 119 000 (3) රු. 149 000 (4) රු. 179 000

(36) මෙම ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය,

(1) රු. 37000 (2) රු. 156 000 (3) රු. 115 000 (4) රු. 13 700

(37) ගවේෂ්ගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනට මුළු වගකීම්වල වටිනාකම,

(1) රු. 164 000 (2) රු. 160 000 (3) රු. 120 000 (4) රු. 171 000

(38) මෙම ව්‍යාපාරයේ 2024.12.31 දිනට ජංගම වත්කම් වල වටිනාකම,

(1) රු. 162 000 (2) රු. 174 000 (3) රු. 132 000 (4) රු. 130 000

(39) ගවේෂ්ගේ ව්‍යාපාරයේ වර්ෂය තුළ මුළු ආදායම,

(1) රු. 50 000 (2) රු. 37 000 (3) රු. 61 000 (4) රු. 49 000

(40) පහත සඳහන් කාණ්ඩ අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) දළ ලාභය = විකුණුම් + විකුණුම් පිරිවැය
(2) විකුණුම් පිරිවැය = ප්‍රාග්ධනය - විකුණුම්
(3) වත්කම ධාරණ අගය = පිරිවැය - සමුච්චිත ක්ෂය
(4) ශුද්ධ ලාභය = දළ ලාභය + වෙනත් ආදායම්

උපදෙස් :-

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසේ ප්‍රශ්න 2 ක් ද, II කොටසේ ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

අ.පොස (උ.පෙළ) වාණිජ විෂය ධාරාවෙන් ඉගෙනුම ලබා කළමණාකරණ උපාධියක් ලබා ඇති පසිඳු නිම්සර, සංචාරක පරාදිසයක් වූ ඇල්ල ප්‍රදේශයේ කඩ කාමරයක් කුලියට ගෙන, දේශීය ආහාර වඩාත් ගුණාත්මකව සපයන අවන්හලක් ''පසිඳු ෆුඩ්ස්'' නමින් 2025.01.01 දින ආරම්භ කරන ලදි.

ඒ සඳහා ඔහු සතුව පැවති රු. 500, 000 ක මුදලද, රු. 200,000 ක් වටිනා ලී බඩු ද යොදවන ලදි. ආහාර සැකසීම පිළිබඳව මනා දැනුමක් ඇති සේවකයන් දෙදෙනෙක් බඳවාගත් ඔහු 2025.01.05 දින 12% ක වාර්ෂික පොලියට රු. 80,000 ක බැංකු ණයක් ද ලබා ගත්තේය.

ජනවාරි මාසය තුළ සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

2025.01.03 - එළවළු හා පලතුරු මිලදී ගැනීම රු. 20 000
2025.01.04 - උපකරණ හා භාජන ගැනීම රු. 100,000
2025.01.07 - ආහාර විකුණුම් ආදායම රු. 20000
2025.01.12 - විදුලි ගාස්තු රු. 3000 ක් ගෙවීම
2025.01.16 - පළතුරු බීම ආදායම රු. 24000
2025.01.20 - ණයට බඩු තොග ගැනීම රු. 16000
2025.01.26 - ආහාර විකුණුම් ආදායම රු. 90 000

බඩඉරිඟු හා රටකජු මිශ්‍ර ආහාර වර්ග රාශියක් ද දේශීය පලතුරු වලින් රසවත් බීම වර්ග ද සැපයීම නිසා සංචාරකයින්ගේ ඉල්ලුම ද ආහාර සඳහා වැඩිවී ඇත. මේ නිසා අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාරයක් බවට තම ව්‍යාපාරය පත් කිරීමට පසිඳු තීරණය කළේය. චෙක්පත් මගින් ගනුදෙණු කිරීම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට ද ඔහු අදහස් කරයි.

(i) (අ) පසිඳුගේ ව්‍යාපාරවල සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(ආ) හිමිකම අනුව ''පසිඳු ෆුඩ්ස්'' ව්‍යාපාරයට අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) (අ) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්වේද?
(ආ) එම ව්‍යාපාර සංවිධානයේ අවාසි 2 ක් ලියන්න.

(iii) මෙම ව්‍යාපාරයේ ශක්තීන් හා අවස්ථාවක් ලියන්න.

(iv) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කල යුතුද? එසේ නම් හේතු දක්වන්න.

(v) (අ) අඛණ්ඩ පැවැත්මක් තිබීමට නම් පසිඳුට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(ආ) මෙම සිද්ධියේ සඳහන් කළමනාකරණ කාර්යයන් 2 ක් ලියන්න.

(vi) 2025.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

(vii) (අ) සිද්ධියේ සඳහන් ගනුදෙණුවලට අදාල මූලික පොත් 2 ක් ලියන්න.
(ආ) එම මූලික පොත්වලට අදාල මූලාශ්‍ර ලේඛණ 1 බැගින් දක්වන්න.

(viii) මෙම ව්‍යාපාරයේ හිමිකම වැඩිවන හා හිමිකම අඩුවන ගනුදෙණුව බැගින් ලියන්න.

(ix) ''පසිඳු ෆුඩ්ස්'' ව්‍යාපාරයේ 2025 ජනවාරි මාසයේ ලාභය ගණනය කරන්න.

(x) ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුදල් ශේෂය ගණනය කරන්න. (ලකුණු 02 බැගින් 20)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(මෙම කොටසින් තෝරාගත් ප්‍රශ්න 2 කට පමණක් පිළිතුරු ලියන්න.)

(02) (i) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරවල දක්නට ලැබෙන පොදු අරමුණු 2 ක් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) වුවමනා නිර්මාණය කළ නොහැකි අතර අවශ්‍යතා නිර්මාණය කළ හැකිය

(ආ) සිල්ලර වෙළෙඳාම යනු නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීමයි

(ඉ) සැපයුම්කරුවන් හා ගනුදෙණුකරුවන් ව්‍යාපාරයක බාහිර පරිසර සාධක වලට අයත් වේ.

(ඊ) යටිතල පහසුකම් ප්‍රතිපත්ති හා අයවැය ප්‍රතිපත්ති නෛතික පරිසරයට අයත්වන කරුණු වේ.

(iii) පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායක 2 ක් ලියන්න.

(iv) ගෝලීය පරිසරය යනු කුමක් ද? (ලකුණු 02 බැගින් 08)

තනුජ හා වරුණ වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඒ සඳහා ඔවුන් විවිධ ව්‍යාපාර සංවිධාන පිළිබඳව අධ්‍යනයක යෙදෙන බව පවසයි.

(03) (i) තනි පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර අතර වෙනස්කම් 2 ක් දක්වන්න.

(ii) සමූපාකාර සමිතිවල ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.

(අ) සිල්ලර වෙළෙඳාම තොග වෙළෙඳාමෙන් වෙනස්වන්නේ මිලදී ගැනීමේ චේතනාව මතය.

(ආ) ස්ථාවර තැන්පතු හා සම්බන්ධ කොන්දේසි බැංකුවේ කැමැත්ත අනුව වෙනස්කළ හැකිය.

(ඉ) ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණය සන්නිවේදන මූලිකාංග වලට අයත් වේ.

(ඊ) චෙක්පතක බැංකුවේ නමක් සඳහන් වන රේඛණය විශේෂ රේඛනයයි.

(iv) (අ) ජීවිත රක්ෂණය හා දේපල රක්ෂණය අතර වෙනස්කමක් ලියන්න.

(ආ) ප්‍රවාහන මූලිකාංග 2 ක් ලියන්න. (ලකුණු 02 බැගින් 08)

(04) (i) පහත ප්‍රකාශ වලින් දැක්වෙන කළමනාකරණ කාර්යයන් ලියන්න.

(අ) ව්‍යාපාර පළපුරුදු සේවකයන් බඳවා ගැනීම.

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ලොරි රථයක් මිලදී ගැනීමට තීරණය කිරීම.

(ඉ) ව්‍යාපාරයේ නිෂ්පාදන කළමනාකරු විසින් සේවකයන්ට උපදෙස් ලබා දීම.

(ඊ) ව්‍යාපාරයේ නිෂ්පාදන ක්‍රියාවලියේ නිවැරදිතාවය පරීක්ෂා කිරීම

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.

(අ) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් සමාගමක හිමිකරුවෙකු බවට පත්වේ.

(ආ) නිෂ්පාදන ක්‍රියාවලිය සැලසුම්කල ආකාරයට සිදුවන්නේ ද යන්න සොයා බැලීම මෙහෙයවීමයි

(ඉ) ප්‍රවර්ධනය අලෙවිකරණය මිශ්‍රයේ විචල්‍යයකි

(ඊ) වෙළෙඳපලක් යනු ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන නිශ්චිත ස්ථානයක් නොවේ.

(iii) බිමාෂ්ගේ පියා රජයේ සේවකයෙන් විශ්‍රාම ගොස් ඇත. පියාගේ විශ්‍රාම පාරිතෝෂික මුදල වඩාත් අවධානම අඩු, වැඩි පොලියක් ලැබෙන ආයෝජන මාර්ගයක යෙදවීමට ඔවුන් අදහස් කරයි.

(අ) අවධානමට අඩු ආයෝජන මාර්ග 2 ක් දක්වන්න.

(ආ) එම මුදල් ස්ථාවර තැන්පතු ගිණුමක යෙදවීමෙන් ලැබිය හැකි වාසි 2 ක් ලියන්න.

(iv) ව්‍යාපාරයක් තම භාණ්ඩ අලෙවිය වැඩි කරගැනීමට යොදාගන්නා විවිධ උපක්‍රම 2 ක් ලියන්න.

(ලකුණු 02 බැගින් 08)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න 2 කට පමණක් පිළිතුරු ලියන්න.)

(05) (i) වගකීමක ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ලෙජරය යනු කුමක් ද? (ලකුණු 01)

(iii) (අ) නමිඳුගේ ව්‍යාපාරයේ 2025 පෙබරවාරි මාසයේ ගනුදෙණු කීපයක් පහත දැක්වේ.
එම ගනුදෙණු පහත වගුව උපයෝගී කරගෙන ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න.

ගණුදෙනු	වත්කම් =			හිමිකම් +	වගකීම්	
	ණය ගැතියෝ	බඩු තොග	මුදල	ප්‍රාග්ධනය	බැංකු ණය	ණය හිමියෝ
ශේෂය	40 000	30 000	100 000		50 000	20 000
1.						
2.						
3.						
4.						

ගණුදෙනු :-

(1) ණයහිමියෙකුට මුදල් ගෙව්වා රු. 10 000

(2) රු. 75 00 ක බඩු තොගයක් රු. 10 000 කට ණයට විකුණුවා

(3) රු. 5000 ක ණය පොලී ඇතුළුව බැංකු ණය ආපසු ගෙව්වා රු. 8000

(4) කඩ කුලී ගෙව්වා රු. 8000 (ලකුණු 04)

(ආ) 2025 පෙබරවාරි 28 දිනට හිමිකම ගණනය කරන්න. (ලකුණු 01)

(iv) නවෝද්‍යාගේ ව්‍යාපාරයේ 2025.01.01 දිනට අත ඉතිරි ශේෂය රු. 1300 කි. අග්‍රිමය රු. 6000 කි. ජනවාරි මාසයේ පළමු දෙසතිය තුළ සුළු මුදල් ගනුදෙණු කීපයක් පහත දැක්වේ.

2025.01.02 - ගෙන ඒමේ කුලී රු. 300
2025.01.03 - ලිපි ද්‍රව්‍ය ගත්තා රු. 200
2025.01.05 - ගමන් වියදම් රු. 150
2025.01.07 - සංග්‍රහ වියදම් රු. 250
2025.01.09 - සි.ආර්. පොත් රු. 360
2025.01.10 - බස් ගාස්තු රු. 240
2025.01.11 - තැපැල් වියදම් රු. 300
2025.01.13 - සිසිල් බීම රු. 350

අවශ්‍ය වන්නේ :- ලිපිද්‍රව්‍ය, ගමන් වියදම්, සංග්‍රහ වියදම්, විවිධ වියදම්, ලෙජර් ගිණුම යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක් පිළියෙල කිරීම. (ලකුණු 04)

(06) (i) දුන් වට්ටම් හා ලද වට්ටම් වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න. (ලකුණු 02)

(ii) ''උදාහිරු' ළමා සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 කි. එක් සාමාජිකයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 400 කි. 2025 ජනවාරි මාසයට අදාළ මුදල් ගනුදෙනු පහත දැක්වේ.

සඟරා වියදම්	රු. 7000
ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම	රු. 2000
සඟරා විකුණුම් ආදායම	රු. 10 000
ප්‍රවාහන ගාස්තු	රු. 1200
පරිත්‍යාග ලැබීම්	රු. 5000

අමතර තොරතුරු :-

(1) සඟරා මුද්‍රණ වියදම් රු. 1000 ක් ගෙවීමට ඇත.

(2) සාමාජිකයන් 20 දෙනෙකු ජනවාරි මාසයේ සාමාජික මුදල් ගෙවා නැත.

අවශ්‍ය වන්නේ :-

(1) 2025 ජනවාරි මාසයේ ලැබීම් හා ගෙවීම් ගිණුම සාදන්න. (ලකුණු 04)

(iii) සුදම්ගේ ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ බැංකු ගිණුමේ ශේෂය රු. 78 000 කි. බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය එයට වෙනස් වූ අතර වෙනසට හේතු පහත දැක්වේ.

(1) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්

චෙක්පත් අංක 108 රු. 4750

චෙක්පත් අංක 115 රු. 7100

(2) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් වල වටිනාකම රු. 5300 (චෙක්පත් අංක 98)

(3) බැංකු ප්‍රකාශනයේ සඳහන්ව ඇති පහත සඳහන් දෑ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සඳහන්ව නැත.

- බැංකු වට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 8000
- ස්ථාවර නියෝග මත ගෙවීම් - ණය වාරිකය රු. 7500

  බැංකු ගාස්තු රු. 1200 යි

අවශ්‍ය වන්නේ :-

I බැංකු ගිණුම සංශෝධනය කිරීම

II බැංකු සැපයුම් ප්‍රකාශය පිළියෙල කිරීම

(ලකුණු 04)

(iv) ශේෂ පිරික්සුමේ සමානාත්වයට බල නොපාන වැරදි හා ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරදි 01 බැගින් ලියන්න. (ලකුණු 02)

(07) (i) සීමිත ''බෙහන්සා'' ඇගළුම් නිශ්පාදන සමාගමේ 2025 මාර්තු මාසයේ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

රෙදි මිලදී ගැනීම	රු. 125000
නිශ්පාදන වැටුප්	රු. 5600
කම්හල් විදුලිය	රු. 24000
මෝස්තර නිර්මාණ කුලී	රු. 20 000
නූල් බොත්තම් ආදිය ද්‍රව්‍ය ගැනුම්	රු. 10 000
යන්ත්‍ර ක්ෂය	රු. 2000
කම්හල් රක්ෂණය	රු. 6000
මුරකරු වැටුප්	රු. 20 000

පහත සඳහන් දෑ ගණනය කරන්න.

1. ප්‍රාථමික පිරිවැය 2. පොදු කාර්ය පිරිවැය (ලකුණු 04)

(ii) සහේළිගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

විස්තරය	හර	බැර
ප්‍රාග්ධනය	-	600 000
ගැණුම්	70 000	-
2024.01.01 තොගය	30 000	-
විකුණුම්	-	150 000
ණය ගැතියෝ සහ ණය හිමියෝ	20 000	42 000
10% බැංකු ණය	-	100 000
ණය පොලී	4000	-
ගොඩනැගිලි (පිරිවැයට)	400 000	-
උපකරණ (පිරිවැයට)	200 000	-
12% ස්ථාවර තැන්පතු	100 000	-
දුන් වට්ටම් හා ලද වට්ටම්	6000	8500
වෙළෙඳසේවක වේතන	18000	-
රක්ෂණ ගාස්තු	7500	-
ගැනිලි	6200	-
උපකරණ ක්ෂය වෙන්කිරීමේ 2024.01.01 දිනට	-	14 000
බැංකු ගාස්තු	7200	-
ප්‍රචාරණ වියදම්	15000	-
පරිපාලන වේතන	22000	-
කඩකුලී	17000	-
බැංකු ශේෂය	-	20 000
මුදල් ශේෂය	11600	
	934 500	**934 500**

අමතර තොරතුරු :-

1. 2024.12.31 දිනට ඉතිරි බඩු තොගය රු. 12 000 කි.
2. උපකරණ පිරිවැය මත 10% ක් ක්ෂය කරන්න.
3. උපචිත කඩ කුලී වියදම් රු. 1000 ක් වේ.

අවශ්‍ය වන්නේ,

1. සහේළිගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)
2. 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)